# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## 02 වන පාඩම; චතුරාර්ය සත්‍යය

[[ 2024/2025 ]] 02 වන ප්‍රශ්නය

I චතුරාර්ය සත්‍යයේ සෑම සත්‍යකින්ම අවධානයට ලක් කෙරෙන ධර්ම සංකල්පයේ නම ලියන්න.
II දුක්ඛ සමුදය අරිය සච්ච කෙටියෙන් හඳුන්වන්න.
III අ) දුක්ඛ සච්චයේ ඇතුළත් තෙවැදෑරුම් දුක නම් කරන්න.
ආ) "බුදුසමය දුක පිළිබඳව කරන අනාවරණය යථාර්ථවාදී වේ." පැහැදිලි කරන්න.
IV සාර්ථක සමාජ ජීවිතයක් ගොඩනගා ගැනීමට ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ඇති උපයෝගීතාව පැහැදිලි කරන්න.

[[ 2020/2021/2022/2023 ]] 02 වන ප්‍රශ්නය

I චතුරාර්ය සත්‍ය ධර්ම පිළිවෙළින් නම් කරන්න.
II චතුරාර්ය සත්‍ය ධර්ම අතුරින් දෙකක් හඳුන්වා දෙන්න.
III අ) ක්ලේශ හා ස්කන්ධ පරිනිර්වාණයන් සඳහා භාවිතා කරන පරිනිර්වාණ අවශ්ථා දෙක නම් කරන්න.
ආ) ඉහත තුන්වන ප්‍රශ්නයෙහි දැක්වූ අවශ්ථා දෙකෙහි වෙනස පැහැදිලි කරන්න.
IV "අන්තවාදී නොවී කටයුතු කිරීමේ වැදගත්කම මධ්‍යම ප්‍රතිපදා(මජ්ඣිමා පටිපදා) මාර්ගයෙහි ඉදිරිපත් කරයි." මෙම ප්‍රකාශයේ සත්‍යතාවය අනාවරණය කරන්න.

[[ 2019/2020]] 02 වන ප්‍රශ්නය

I ආර්ය මාර්ගයට අයත් අංග අට අනුපිළිවෙළින් ලියා දක්වන්න.
II එකී අංගවලින් ඔබ කැමති අංග හතරක් කෙටියෙන් හඳුන්වා දෙන්න.
III අ) මෙම අංග ඇතුළත් වන ආර්ය සත්‍යයේ නම ලියන්න.
ආ) බුදුන් වහන්සේ එම ආර්ය සත්‍ය ප්‍රථමයෙන්ම දේශනා කළේ කවුරුන් හටද? කොහේදී දැයි සඳහන් කරන්න.
IV විමුක්තිය(නිවන) අවබෝධ කර ගැනීමට පමණක් නොව,යහපත් දිවි පැවත්මක් ගෙන යාමට ද ආර්ය මාර්ගය හේතුවන ආකාරය පහදා දෙන්න.

[[ 2018/2019 ]] 02 වන ප්‍රශ්නය

I චතුරාර්ය සත්‍ය ධර්ම නම් කරන්න.
II ඒවා ආර්ය සත්‍ය නාමයෙන් විශේෂ කොට දැක්වීමේ හේතුව පහදා දෙන්න.

III සිව්වන ආර්ය සත්‍ය ‘මජ්ඣිමා පටිපදා’නාමයෙන් හඳුන්වාදීමේ වැදගත්කම පෙන්වාදී එම ප්‍රතිපදාවට අයත් අංග අනුපිළිවෙළින් දක්වන්න.

IV බෞද්ධ විනය මාර්ගයට අයත් පියවර තුන දක්වා එම පියවරවලින් අපේක්ෂිත කාර්යය පෙන්වාදී,එහි පළමු පියවර අනුගමනය නොකිරීම වත්මන් සමාජ සංස්ථාව බිඳ වැටීමට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

## [[ 2017/2018 ]] 02 වන ප්‍රශ්නය

I දුක ඇතිවීමේ හේතුව දක්වා, ආර්ය සත්‍ය නම් කර, එම හේතුව කුමක්දැයි පෙන්වා දෙන්න.

II එය ස්වරූප වශයෙන් කී වැදෑරුම් වේදැයි දක්වා ඒවා නම් කරන්න.

III එම ස්වරූප හඳුන්වන්න.

IV ලෝකයේ විවිධ ගැටළු පැන නැගීමට එම හේතුව මූලික කාරණාවක් වන්නේ දැයි පෙන්වා දෙන්න.

## [[ 2016/2017 ]] 02 වන ප්‍රශ්නය

I ආර්ය අෂ්ඨාංගික මාර්ගයට අයත් අංග දක්වන්න.

II එම අංග ත්‍රි ශික්ෂාවට අයත් වන සේ බෙදා දක්වන්න.

III දුක නැති කිරීමේ ප්‍රතිපදාව ලියා,එයින් ප්‍රතික්ෂේපිත අන්ත දෙකේ ස්වභාවය පහදන්න.

IV අන්තවාදීව ක්‍රියා කිරීම පුද්ගල හා සමාජ පරිහානියට හේතුවන ආකරය පෙන්වා දෙන්න.

## [[ 2015/2016 ]] 02 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය දේශනාව ඇතුළත් ප්‍රථම ධර්ම දේශනාවේ නම දක්වා එය ශ්‍රවනය කළ පිරිස කවුරුන්දැයි පෙන්වා දෙන්න.

II එම ආර්ය සත්‍යයෙහි ප්‍රභේද හතර සිංහල පාලි භාෂා දෙකෙන්ම දක්වන්න.

III ප්‍රථම ආර්ය සත්‍යට ඇතුළත්ව ඇති,සමාජයේ සෑම කෙනෙකුම මුහුන දෙන ලක්ෂණ හතරක් දක්වා, ඒවා ඇතුළත් දුක්ඛ ප්‍රභේදයේනම ලියන්න.

IV පුද්ගලයා හා සම්බන්ධ අධ්‍යාත්මකවුත් බාහිරවුත් සියල්ලක්ම මොහොතක් මොහොත පවත්නා තත්ත්වයෙන් වෙනස්වෙන ආකාරය කෙසේදැයි පහද දෙන්න.

## [[ 2013/2014 ]] 02 වන ප්‍රශ්නය

I බෞද්ධ විමුක්ති මාර්ගය පියවර තුනකින් යුක්තය.ඒ පියවර තුන නම් කරන්න.

II එම පියවරට අයත් අංග අට දක්වා, තමා කැමති අංග දෙකක් හඳුන්වන්න.

III එකී අංග අට ඇතුළත් ප්‍රථම සූත්‍ර දේශනාවේ නම ලියා,එය කවර පිරිසකට කොතනකදී දේශ්නා කරන ලද්දේ දැයි පෙන්වා දෙන්න.

IV කායික හා වාචසික සමාචාරයක් සකස් කර ගැනීමට අවශ්‍යවන පියවර කුමක්දැයි දක්වා, එමඟින් කායික වාචසික සමාචාරය ඇති කරගන්නා අයුරු පහදන්න.

## [[ 2012/2013 ]] 03 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය සතර දක්වන්න.
II තෘෂ්ණාව ඇතුළත් සත්‍ය නම් කර,එහි ත්‍රිවිධ ප්‍රභේද ලියන්න.
III එම ප්‍රභේද කෙටියෙන් හඳුන්වන්න.
IV ධර්මානුකූලව සිතීමෙන් තෘ ෂ්ණාව පාලනය කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

## [[ 2011/2012 ]] 02 වන ප්‍රශ්නය

I ආර්ය අෂ්ඨාංගික මාර්ගය ඇතුළත් ආර්ය සත්‍ය නම් කරන්න.
II එම අංග අට ලියන්න.
III ත්‍රි ශික්ෂාව දක්වා එහි අංග අට එයට ඇතුළත් කර දක්වන්න.
IV සහනය හා සැනසිල්ල ලබා දෙන ජීවිතයක් ගත කිරීමට මෙම ආර්‍ය මාර්ගය යොදාගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

## [[ 2010/2011 ]] 02 වන ප්‍රශ්නය

I බුදුන් වහන්සේ විසින් පෙන්වා දී ඇති දුක හටගැනීමේ හේතුව දක්වා එයට අදාළ වන සත්‍යය නම් කරන්න.
II එම හේතුවට අයත් ප්‍රභේද සංඛ්‍යාව ලියා ඒවා නම් වශයෙන් දක්වන්න.
III එකී ප්‍රභේද කෙටියෙන් හඳුන්වන්න.
IV “ දුක හට ගැනීමේ හේතුව නොදැනීම නිසා සත්ත්වයා සසර සැරි සරයි.”පැහැදිලි කරන්න.

## [[ 2009/2010 ]] 03 වන ප්‍රශ්නය

I ආර්ය මාර්ගයට අයත් අංග දක්වන්න.
II බැහැර කළ යුතු අන්තද්වය නම් කොට,ඒවා හඳුන්වා,එයින් බැහැර වූ ප්‍රතිපදාව බුදුසමය බුදුසමය පැහැදිලි කරන්නේ කවර නමකින්දැයි පෙන්වා දෙන්න.
III බෞ විනය මාර්ගයට අයත් පියවර තුන දක්වා,ආර්ය මාර්ගයේ පෙන්වා ඇති අංග ඒවාට ඇතුළත් කරන්න.
IV විමුක්තිය (නිවන)සාධා ගැනීමට පමනක් නොව,සාර්ථක දිවි පැවත්මක් ගෙන යාමටද එම පියවර තුන උපයෝගී වන අයුරු පැහැදිලි කරන්න.

## [[ 2008/2009 ]] 03 වන ප්‍රශ්නය

I “තෘෂ්ණාව ත්‍රිවිධය”ඒවායින් දෙකක් දක්වන්න.

II එම ප්‍රභේද දෙක හඳුන්වන්න.
III තෘෂ්ණාව ඇතිවන්නේ කවරක් නිසා දැයි ලියා,එම තණ්හාව සඳහා විවිධ අවශ්ථාවන්හී යෙදෙන සමාන නාම පද හතරක් දක්වන්න.
IV ලෝකයේ විවිධ ගැටළු පැන නැගීමට තෘෂ්ණාව හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

## [[ 2007/2008 ]] 02 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය සතර නම් කරන්න.
II එම සත්‍යයන්ගෙන් බුදුසමය පරම නිෂ්ඨාව ලෙස පිළිගන්නේ කවර සත්‍යක්දැයි පෙන්වා දී එම සත්‍ය හඳුන්වන්න.
III ක්ලේශ හා ස්කන්ධ පරිනිර්වාණයන් සඳහා භාවිතා කරන අනෙක් පරිනිර්වාණ අවශ්ථා දෙක දක්වා,ඒවායේ වෙනස පැහැදිලි කරන්න.
IV තුන් ආකාරයකින් නිර්වණාවබෝධයට පත්වන උතුමන් තිදෙනා නම් කර එක් උතුමෙක් ගැන හැඳින්වීමක් කරන්න.

## [[ 2006/2007 ]] 03 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය සතර නම් කරන්න.
II විපරිනාම දුක්ඛ යනු කුමක්දැයි දක්වන්න.
III තණ්හාව නිසා මිනිසා කුසලයට මෙන්ම අකුසලයටද නැඹුරු වන අයුරු පෙන්වා දෙන්න.
IV ආර්ය අෂ්ඨාංගික මාර්ගය මධ්‍යම ප්‍රතිපදාව දක්වා ඇත්තේ කවර හේතු නිසා දැයි පහදා සම්මා කම්මන්ත,සම්මා ආජීව යන මාර්ගාංග දෙක හඳුන්වන්න.

## [[[ 2005 ]]] 02 වන ප්‍රශ්නය

I දුක ඉපිදවීමේ හා ඇතිවීමේ හේතුව දක්වන ආර්‍ය සත්‍යයේ නම ලියන්න.
II එය ස්වරූප වශයෙන් කී වැදෑරුම් ද? නම් වශයෙන් දක්වන්න.
III ඒවායින් කැමති එක් ස්වරූපයක් හඳුන්වා දෙන්න.
IV ලෝකයේ විවිධ ගැටළු පැන නැගීමට එම හේතුව බලපාන ආකාරය සැකෙවින් දක්වන්න.

## [[[ 2004 ]]] 02 වන ප්‍රශ්නය

I සම්මා සංකප්පයට අයත් ප්‍රභේද නම් කරන්න.
II එම ප්‍රභේද වලින් දෙකක් හඳුන්වා දෙන්න.
III "සම්මා" යන උප පදය එම සංකප්පය විශේෂ කොට දැක්වීමේ හේතුව පහදන්න.
IV පවිත්‍ර මනසක් ඇතිකර ගැනීමට "සම්මා සංකප්පය" උපයෝගී වන අයුරු විස්තර කරන්න.

## [[[ 2003 ]]] 02 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය සතර පිළිවෙළින් නම් කරන්න.
II දෙවන ආර්ය සත්‍ය හඳුන්වන්න.
III බුදු සමයේ පරම නිෂ්ඨාව දුක්ඛ නිරෝධය බව පෙන්වා දෙන්න.
IV ආර්ය අෂ්ඨාංගික මාර්ගය ශීල,සමාධි,ප්‍රඥා යන පියවර තුනකින් දැක්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

## [[[ 2002 ]]] 01 වන ප්‍රශ්නය

I චතුරාර්ය සත්‍ය නම් කරන්න.
II ඒවායින් පළමු සත්‍ය තුනෙන් එකක් විසතර කරන්න.
III කාමසුඛල්ලිකානු යෝගය නිවනට බාධාවක් වන අයුරු පහදන්න.
IV අරි අටඟි මඟ විස්තර කරන්න.

## [[[ 2001 ]]] 03 වන ප්‍රශ්නය

I තෙවැදෑරුම් තණ්හාව නම් කරන්න.
II ඒවායින් එකක් විස්තර කරන්න.
III ඉපදීම දුකක්දැයි පහදන්න.
IV නිර්වාණය පිළිබඳව හැඳින්වීමක් කරන්න.

## [[[ 2000 ]]] 01 වන ප්‍රශ්නය

I දෙවැදෑරුම් දුක නම් කරන්න.
II ඒවායින් එකක් විස්තර කරන්න.
III "ලොව දුක මත පිහිටා ඇත" පහදන්න.
IV දුක්ඛ නිරෝධ මාර්ගය පැහැදිලි කරන්න.

## [[[ 1999 ]]] 04 වන ප්‍රශ්නය

I චතුරාර්ය සත්‍ය අනුපිළිවෙළින් නම් කරන්න.
II මෙම ඉගැන්වීම ප්‍රථමවරට බුදුන් වහන්සේ දේශනා කළේ කාහටද?
III 'දුක්ඛ' සංකල්පය ගැන හැඳින්වීමක් කරන්න.
IV දුක කෙළවර කිරීමට චතුරාර්ය සත්‍ය පිළිබඳ අවබෝධය උපකාර වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

## [[[ 1998 ]]] 01 වන ප්‍රශ්නය

I ආර්ය සත්‍ය සතර අනුපිළිවෙළින් නම් කරන්න.

II මේ චතුරාර්ය සත්‍ය පළමුවරට දේශනා කරන ලද්දේ කොතැන්හී ද කා හට දැයි දක්වන්න.
III තුන් වන ආර්ය සත්‍ය ගැන කෙටි හැඳින්වීමක් ලරන්න.
IV චතුරාර්‍ය සත්‍යය බුදු දහමේ හරය වශයෙන් හැඳින්වීම කෙතරම් නිවැරදිදැයි සාකච්ඡා කරන්න.

## [[1997 ]] 02 වන ප්‍රශ්නය

බුදුන් දවස ප්‍රචලිතව පැවති අන්තගාමී ආගමික ප්‍රතිපදාවන් දෙක සැකෙවින් හඳුන්වා මේ අන්ත දෙකෙන් වෙන්වෙන බෞද්ධ ප්‍රතිපදාව විස්තර කරන්න.

## 03 වන ප්‍රශ්නය

ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සීල කොටස කෙටියෙන් හඳුන්වා,සම්මා ආජීව අංගය ප්‍රගුණ කිරීමෙන් වන යහපත ගෙනහැර දක්වන්න.